# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෘතීය පරීක්ෂණය (බාහිර) - 2010
2012 අප්‍රේල්/ මැයි/ ජූනි

මානවශාස්ත්‍ර පීඨය

**පාලි - PALI E3025**

**පාලි පිටකාගත දර්ශනය, ආචාරධර්ම හා මූලාශ්‍රය අධ්‍යයනය**

කොටස් තුනෙන්ම ඇතුළත් වන සේ **ප්‍රශ්න පහකට (05)** පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි** **කාලය : පැය 03 යි**

---

### 1 කොටස

01. සත්‍යය සහ කෘත්‍යය අතර ඇති සම්බන්ධය චතුරාර්ය සත්‍ය දේශනාව මුල්කොට ගෙන පෙන්වා දෙන්න.

02. ප්‍රතීත්‍ය සමුත්පාද න්‍යායේ ප්‍රධාන සහ අතිරේක අරමුණු මොනවාදැයි පරීක්‍ෂා කරන්න.

03. ත්‍රිපිටකාගත සාධක ඔස්සේ පුනර්භව සංකල්පය තහවුරු කරන්න.

### 11 කොටස

04. අදත්තාදානය නිසා ගිහි පැවිදි දෙපාර්ශවයේ ම ආධ්‍යාත්මික සහ සාමාජික පරාජය සිදු වන බවට කරුණු ගෙනහැර දක්වන්න.

05. උත්තර මනුෂ්‍ය ධර්ම මොනවා දැයි හඳුන්වා දී, ඒවා ප්‍රකට කිරීමට අදාළ ශාසනික පසුබිම විමසුමට ලක් කරන්න.

06. ඛන්ධක ග්‍රන්ථයන්හි අන්තර්ගතය උසස් චර්යා රටාවක් පිණිස කෙසේ උපයෝගී වේ දැයි පැහැදිලි කරන්න.

## <u>111 කොටස</u>

07.

තතො පභුති මහාවිහාරවාසිකා භික්ඛූ ච අභයගිරිවාසිකා භික්ඛූ ච ද්වෙධා භින්නා ද්වෙ නිකායා ජාතා.

"තතො අභයගිරිවිහාරපතිට්ඨානතො පන සත්තපඤ්ඤාසවස්සාධිකෙසු තීසු වස්සසතෙසු වීතිවත්තෙසු **මහාසෙනො** නාම රාජා ලඞ්කාදීපෙ සත්තවීසතිවස්සානි රජ්ජං කාරෙසි. තස්මිං කාලෙ සො රාජා **ජෙතවනවිහාරං** කත්වා **දක්ඛිණවිහාරවාසිස්ස** ජිම්හමානසස්ස අසඤ්ඤතස්ස පාපමිත්තස්ස **තිස්සත්ථෙරස්ස** පදිනා අදාසි. තතො පට්ඨාය ජෙතවනවිහාරවාසිනො භික්ඛූ මහාවිහාරවාසිකෙහි භික්ඛූහි අභයගිරිවාසිකෙහි භික්ඛූහි ච භින්දිත්වා **ජෙතවනවිහාරවාසිනිකායො** නාමෙකො නිකායො ජාතො.

"එවං ලඞ්කාදීපෙ සාසනපතිට්ඨානතො ද්වීසු වස්සසතෙසු භික්ඛූ අපරිපුණ්ණෙසු යෙව ලඞ්කාදීපෙ භික්ඛූ තිධා භින්නා, තයො නිකායා ජාතා. තෙසු මහාවිහාරවාසිනිකායොව 'එකන්තපරිසුද්ධො ධම්මවාදී; සෙසා ද්වෙ නිකායා අපරිසුද්ධා අධම්මවාදිනො. තතො පට්ඨාය ලඞ්කාදීපෙ අනුක්කමෙන ධම්මවාදිනො අප්පතරා දුබ්බලා; අධම්මවාදිනො පන භික්ඛූ බහුතරා බලවන්තා. තෙ විවිධා අප්පටිපත්තියො දුප්පටිපත්තියො ච පටිපජ්ජන්ති. තෙන සාසනං සමලං සකණ්ටකං සාබ්බුදං ජාතං.

i. ඉහත ඡේද සිංහලට නගන්න.

ii. ඒවා බුරුම, නාගර හෝ රෝමන් අකුරෙන් පිටපත් කරන්න.

iii. කල්‍යාණී සිලාලිපිය හඳුන්වා දෙන්න.

08.

සුහඉ වත ජීවමු වෙරනෙෂු අවෙරන
වෙරනෙෂු මනුශෙෂු විහරමු අවෙරන

සුහඉ වත ජීවමු යෙස මු නපී කිංචනි
කිංචනෙෂු මනුශෙෂු විහරමු අකිංචන

ජය වෙර ප්‍රසහති දුඛු ශයති පරයිතු
උවශතු සොහු ශයති හිත්ව ජය පරජය අ

අරොග පරම ලභ සතුඨි පරම ධන
විශ්වශ පරම මිත්‍ර නිවන පරමො සුහ

සුහ දර්ශන අරිඅන සවසො චි සද සුහො
අදසනෙන බලන නිචමෙව සුහි සිඅ

බල සගතචරිඋ දීඝමධ්වන ශොයිෂු
දුඛ බෙලෙහි සවස අමිත්‍රෙහි ච සවුසි
ධීරො ච සුඛ සවස ඤතිහි ව සවුසි

i. ඉහත ප්‍රාකෘත ධම්මපද ගාථා සිංහලට නගන්න.

ii. ඒවා පාලි ධම්මපද ගාථා සමඟ සසඳන්න.

iii. ලෞකික ලෝකෝත්තර අභිවෘද්ධිය සඳහා මාර්ගෝපදේශ මාලාවක් ලෙසින් ධම්මපදය අගයන්න.